කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2014/15

2020 - අගෝස්තු

**BCOM E 3035** - උසස් මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

2018 අප්‍රේල් 01 දින සීමිත කොස්තා සමාගම විසින් සීමිත දෝරා සමාගමේ ශුද්ධ වත්කම් වලින් 80% ක් අත්පත් කර ගන්නා ලදී. 2018 අප්‍රේල් 01 දිනට සමාගම් දෙකෙහි කොටස් වෙළෙඳපල අගය වනුයේ,

කොස්තා - රු.30
දෝරා - රු.20

2019 මාර්තු 31 දිනට කොස්තා සහ දෝරා සීමිත සමාගම් දෙකෙහි සාරාංශ ගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන් පහත දී ඇත.

| | කොස්තා රු '000 | දෝරා රු '000 |
|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 56,000 | 40,000 |
| ආයෝජන | 50,000 | 8,000 |
| තොග | 23,000 | 14,000 |
| වෙළඳ ණය ගැතියෝ | 16,000 | 13,000 |
| මුදල් | 9,000 | 3,000 |
| | **154,000** | **78,000** |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (කොටස් ප්‍රමාණය) | 60,000 (මිලියන 3) | 45,000 (මිලියන 3) |
| රඳවාගත් ඉපයීම් 31.03.2019 | 32,000 | 14,000 |
| 12 % ණයකර | 18,000 | - |
| වෙළෙඳ ණයගැතියෝ | 36,000 | 12,000 |
| බදු වගකීම | 8,000 | 7,000 |
| | **154,000** | **78,000** |

අතිරේක තොරතුරු

i අත්පත් කර ගත් දිනට දෝරා සමාගමේ පැවැති දේපලක සාධාරණ අගය එහි ධාරණ අගයට වඩා රු. මිලියන 6 ක් වැඩි බව හඳුනාගන්නා ලදී. මෙම දේපලහි ඉතිරි ජීවිත කාලය වසර 6 කි.

ii. 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා දෝරා සමාගමේ ලාභය රු. මිලියන 6 කි.

iii. සමාගම් දෙක විසින්ම සරළ මාර්ග ක්‍රමයට වත්කම් ක්ෂය කරනු ලබයි.

iv. 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය තුල සීමිත කොස්තා සමාගම විසින් සීමිත දොරා සමාගමට රු. 540,000 කට භාණ්ඩ අලෙවි කරන ලදී. කොස්තා සමාගම විසින් මෙම භාණ්ඩ පිරිවැයට 50% ක අධිකයක් එකතු කොට මිල ලකුණු කර ඇත. 2019 මාර්තු 31 දින දෝරා සමාගමේ තොගය තුල මෙම භාණ්ඩ වලින් තුනෙන් එකක් ඇතුලත්ය. 2019 මාර්තු 31 දිනට අන්තර් සමූහ ගෙවිය යුතු /ලැබිය යුතු ශේෂයන් නොමැත.

v. බදු නොසලකා හරින්න.

ඔබ විසින් පහත දෑ පිළියෙල කළ යුතුය.

අ. සීමිත දෝරා සමාගම අත්පත්කරගැනීමේ දී ඇතිවූ ඒකාබද්ධ කීර්තිනාමය.

(ලකුණු 05)

ආ. 2019 මාර්තු 31 දිනට කොස්තා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය.

(ලකුණු 20)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක - 02

අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ සංකල්පිත රාමුවට අනුව මූල්‍ය ප්‍රකාශන තුල ගුණාත්මක භාවය ඉහල නැංවීමට උපකාරී වන ගුණාත්මක ලක්ෂණ නම් කර ඉන් දෙකක් සැකවින් පහදන්න.

(ලකුණු 08)

ආ. මූල්‍ය ප්‍රකාශන තුල අඩංගු මූල්‍ය තොරතුරු වල විශ්වාසනීය නිරූපණය ආරක්‍ෂා කිරීමේ ඇති වැදගත්කම එහි නිර්නායකයන් ද සමග සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ඇ. මූල්‍ය ගිණුම්කරණයට අදාලව පහත පද නිර්වචනය කරන්න.

1. ප්‍රමාණාත්මක භාවය
2. පුරෝකතන අගය
3. අනුකූලතා අගය

(ලකුණු 2 බැගින් = ලකුණු 06)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 03

පහත සඳහන් තොරතුරු 2019 මැයි 31 වන දින ඇවර කරන ලද කපිල සීමිත සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදි.

| <u>වත්කම් සහ වගකීම්</u> | <u>පොත් අගය (රු.)</u> |
|---|---|
| 5% වරණීය කොටස් ප්‍රාග්ධනය - කොටස් 50,000 ක් රු. 10 බැගින් | 500,000 |
| හිමිකම් කොටස් ප්‍රාග්ධනය - කොටස් 75,000 ක් රු. 20 බැගින් | 1,500,000 |
| ඉඩම සහ ගොඩනැගිල්ල මත පළමු උකස (first mortgage) | 500,000 |
| ඉඩම සහ ගොඩනැගිල්ල මත දෙවන උකස (second mortgage) | 450,000 |

| | | |
|---|---|---|
| පාවෙන ගාස්තුවකින් (floating charge) සුරක්ෂිත කල, 10% ක ණයකර (2019 මාර්තු 31 දක්වා පොළිය ගෙවන ලදී) | | 250,000 |
| පාවෙන ගාස්තුවකින් (floating charge) සුරක්ෂිත බැංකු අයිරා | | 112,000 |
| ගෙවිය යුතු වෙළඳ ගිණුම් | | 413,000 |
| ගෙවිය යුතු බිල්පත් | | 118,500 |
| ගෙවිය යුතු ආදායම් බදු -2015/16 | 35,000 | |
| -2016/17 | 10,550 | |
| -2017/18 | 4,960 | 50,510 |
| සමාගම ඇවර කිරීම හේතුවෙන් කම්කරුවන්ට ගෙවූ වන්දි | | 313,450 |
| උපචිත වැටුප් සහ වේතන (මාස 5 ක් සඳහා) | | 895,000 |
| ගෙවිය යුතු අධ්‍යක්ෂකගේ වැටුප (ලැබීමට එකඟ වූයේ රුපියල් 30,000 ක් පමණි) | | 40,000 |
| ගෙවිය යුතු වරණීය කොටස් ලාභාංශ | | 50,000 |
| ඉඩම් සහ ගොඩනැගිලි (රු. 1,200,000 ක් උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කර ඇත) | | 1,016,000 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ (රු. 600,000 ක් උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කර ඇත) | | 720,000 |
| සවිකිරීම් (රු.715,000 ක් උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කර ඇත) | | 695,000 |
| පේටන්ට් බලපත්‍රය (රු. 475,000 ක් උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තු කර ඇත) | | 500,000 |
| තොගය (50% අඩුවෙන් උපලබ්ධි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත) | | 485,000 |
| වෙළඳ ණය ගැතියන් (රු. 250,000 ණය අය කරගත හැකි තත්ත්වයක පවතී, රුපියල් 125,000 ක අඩමාන ණයගැතියන්ගෙන් 75% ක් ණය අයවීමට ඇස්තමේන්තු කර ඇති අතර ඉතිරිය බොල්ණය වේ). | | 512,000 |
| ලැබිය යුතු බිල්පත් | | 224,500 |
| පෙරගෙවුම් වියදම් (සම්පූර්ණ ගෙවීම් ප්‍රමාණය ලැබුණි) | | 14,600 |
| මුදල් | | 7,200 |

අමතර තොරතුරු පහත පරිදි වේ.

1) රු. 45,000 ක නෛතික නඩු ගෙවීමක් සඳහා අසම්භාව්‍ය වගකීමක් ඇති අතර, එය පියවීමට රු. 37,000 ක් වැය වන බව ඇස්තමේන්තු කර ඇත.
2) 2015 මාර්තු 31 වන දින සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය රු.325,000 ක වෙළඳ ලාභයක් සහ සාමාන්‍ය සංචිතය රු .68,000 ක් පෙන්නුම්කරන අතර වරණීය කොටස් සහ සාමාන්‍ය කොටස් සඳහා ලාභාංශ 214,000 කි. සමාගමට වෙළඳ අලාභ ලෙස රු. 128,360, රු .244,100, රු .315,000 සහ රු .489,700 ක් පිළිවෙලින් 2015/16, 2016/17, 2017/18 සහ 2018/19 අවසන් වූ වර්ෂවලදී ලැබුණි. 2016/17 දී තොග අලාභය රු .20,000 ක් විය.
3) වගකීම් සඳහා ගෙවීම 2019 ජූනි 30 දින සිදු කරන ලදී.

ඉහත තොරතුරු භාවිතා කරමින් ඔබ විසින් පහත සඳහන් ද ඇපිළියෙල කරන්න.

(අ) සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය (Statement of Company Affairs)

(ආ) ඌණතා / අතිරික්ත ගිණුම (Deficiency/Surplus Account)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 04

අ. ආයෝජකයෙක් විසින් ආයෝජිතයාව පාලනය කරන්නේද යන්න තීරණය කරනු ලබන නිර්ණායක කවරේද ?

(ලකුණු 05)

ආ. 2019 මාර්තු 31 න් අවසන් වර්ෂය තුල සීමිත තෙස්තා සමාගම විසන් කරන ලද වෙන් වෙන් වූ අත්පත්කර ගැනීම් තුනකට අදාල තොරතුරු ඔබට ලබා දී ඇත.

i. සීමිත ඇල්ෆා සමාගමේ ශුද්ධ වත්කම් වලින් 46 % ක් අත්පත් කර ගන්නා ලදී. සීමිත ඇල්ෆා සමාගමට එක් අයෙකු 2 % කට වඩා අඩු ඡන්ද බලයක් සහිත තවත් කොටස්කරුවන් 30 දෙනෙකු සිටී. ඔවුන් රැස්වීම් වලට සහභාගි වී ඡන්දය ප්‍රකාශ කිරීම සිදු කරණුයේ ඉතා කලාතුරකිනි.

ii. සීමිත බීටා සමාගමේ ශුද්ධ වත්කම් වලින් 49 % ක් අත්පත් කරගන්නා ලදී. තෙස්තා සමාගම විසින් බීටා සමාගමේ ප්‍රතිපත්ති සම්පාදනය සිදුකරන අතරම එහි මෙහෙයුම් කටයුතු සඳහා සක්‍රියව දායක වේ. ඉතිරි කොටස් අයිතිය සීමිත සිග්මා සමාගම සතුව ඇති අතර ඔවුන් බීටා සමාගමේ දෛනික කළමනාකරණ කටයුතු වලට සම්බන්ධ නොවේ.

iii. සීමිත බීටා සමාගමේ ශුද්ධ වත්කම් වලින් 46 % ක් අත්පත් කර ගන්නා ලදී. සීමිත බීටා සමාගමට එක් අයෙකුට 27 % ක ඡන්ද බලයක් හිමි තවත් කොටස්කරුවන් දෙදෙනෙකු සිටී. ඔවුන් නිරන්තරයෙන්ම රැස්වීම් වලට සහභාගි වන අතර ඡන්දය ද භාවිතා කරයි.

(ලකුණු 03X05=15)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක - 05

අ. ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 10 - ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රධානියා හා නියෝජිතයා අතර වෙනස පහදන්න.

(ලකුණු 05)

ආ. සීමිත A සමාගම විසින් 2018 අප්‍රේල් 01 දින සීමිත B සමාගමේ ශුද්ධ වත්කම් වලින් 80% ක් අත්පත් කර ගන්නා ලදී. අත්පත් කරගන්නා දිනට අදාලව පහත තොරතුරු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| සීමිත B සමාගමේ ශුද්ධ වත්කම් | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | රු. | 4,500,000 |
| සංචිත | | |
| රඳවා ගත් ඉපැයීම් | රු. | 1,600,000 |
| පොදු සංචිත | රු. | 500,000 |

පාලනය අහිමි කොටස් කරුවන්ගේ ආයෝජනයේ සාධාරණ වටිනාකම රු. 2,000,000

සීමිත A සමාගම විසින් B සමාගමට ලබාදුන් ප්‍රතිෂ්ඨාව

1. මුදලින්
මෙයින් හරි අඩක්, 2019 අප්‍රේල් 01 දින ගෙවීමට පොරොන්තදු වූ අතර A සමාගමේ වර්ධන පොලි අනුපාතිකය 10 % කි.

2. කොටස් නිකුත් කිරීමෙන් රු. 200 කොටස් 10,000 ක් A සමාගම විසින් නිකුත් කරන ලදී. කොටස් නිකුතුව සඳහා රු. 10,000 ක වියදම් දැරීමට සිදු විය.

3. අත්පත් කර ගැනීම සම්බන්ධව නීති ගාස්තු ගෙවීම් රු. 15,000 යි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ව්‍යාපාර සංයෝජන යටතේ ඔබ විසින් මෙම අත්පත් කර ගැනීමට අදාලව කීර්තිනාමය ගණනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 15)